# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2480/07 – 2026 මාර්තු මස 16 වැනි සඳුදා – 2026.03.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2024/89.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එච්. එම්. අජිත් බණ්ඩාර හරස්ගම මයා, අමුණුතැන්න, ගල්ලැල්ල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමඟ, 34/64, ඒ. බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,
කම්කරු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

1A – G 46464 – 13(2026/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2024/89.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. එම්. අජිත් බණ්ඩාර හරස්ගම මයා, අමුණුතැන්න, ගල්ලැල්ල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි සේවයෙහි නියුතු එච්. එම්. අජිත් බණ්ඩාර හරස්ගම මහතාහට පහත සඳහන් කරුණු මත යම් අසාධාරණයක් සිදුව තිබේ ද එසේ සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

1. 2008.08.01 දින සිට පත්කර ඇති ප්‍රවාහන නිලධාරී වැඩ බැලීමේ තනතුරෙහි මේ දක්වාම ස්ථිර නොකිරීම සහ කිසිදු උසස්වීමක් ලබා නොදීම.

2. 2012.12.16 දින සිට ලබා දී ඇති කාර්මික නිලධාරී විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් දීමනා සහ එම තනතුරට නියමිත උසස්වීම් කිසිවක් ලබා නොදීම.”

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0141

---

මගේ අංකය: IR/COM/04/2024/168.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එස්. ටී. ලියනගමගේ මහත්මිය, අංක 369/14, 5 වන පටුමග, ශ්‍රී නන්දසාර මාවත, හෝකන්දර උතුර, හෝකන්දර.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, 34/64, ඒ. බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු**,
කම්කරු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2024/168.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

එස්. ටී. ලියනගමගේ මහත්මිය, අංක 369/14, 5 වන පටුමග, ශ්‍රී නන්දසාර මාවත, හෝකන්දර උතුර, හෝකන්දර.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

" ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කළමනාකරණ සහකාර තනතුරේ වසර 20 ක් සේවයේ නියුක්තව සිටින එස්. ටී. ලියනගමගේ මහත්මියව පරිපාලන නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා 2020 හා 2021 වසරවල පැවති සම්මුඛ පරීක්ෂණවලදී අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න හා එසේ සිදුවී ඇත්නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්නත් වේ."

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.